# ඉන්දිය මහ කොමසාරිස් කාර්යාලය
# කොළඹ

## <u>පුවත්පත් නිවේදනය</u>

## <u>ඉන්දිය සහන ණය යෝජනා ක්‍රමයක් යටතේ සිමාසහිත ඉර්කොන් ජාත්‍යන්තර සමාගම විසින් නැවත ගොඩනංවන ලද පල්ලයි- යාපනය දුම්රිය මාර්ගය සහ සංඥා පද්ධතිය ආරම්භකිරීම</u>

නැවත ගොඩනංවන ලද පල්ලයි - යාපනය දුම්රිය මාර්ගය සහ සංඥා පද්ධතිය ආරම්භ කිරීම නිමිත්තෙන් ඔක්තෝම්බර් මස 13 වැනි දින උත්සවයක් සංවිධානය කරන ලදි. එම උත්සවයට අතිගරු ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ, ප්‍රවාහන අමාත්‍යය කුමාර් වෙල්ගම. සම්ප්‍රදායික කර්මාන්ත සහ කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යය ඩග්ලස් දේවානන්ද, ඉන්දීය මහ කොමසාරිස් ගරු වයි කේ සිංහා, නියෝජ්‍ය ප්‍රවාහන අමාත්‍යය ගරු රොහණ කුමාර දිසානායක, උතුරු පළාත් ආණ්ඩුකාර මේජර් ජෙනරල් (විශ්‍රාමික) ජි ඒ චන්ද්‍රසිරි, පාර්ලිමේන්තු මන්ත්‍රී මුරුගේසු චන්ද්‍රකුමාර්, ගරු සිල්වෙස්ත්‍රි ඇලන්ටින් සහ ප්‍රවාහන අමාත්‍යංශය, ශ්‍රී ලංකා දුම්රිය සේවය, උතුරු පළාත් සභාව සහ සිමාසහිත ඉර්කොන් ජාත්‍යන්තර සමාගම යන ආයතනවල ජ්‍යෙෂ්ට නිලධාරින් සහභාගි වූහ.

2. මෙම උත්සවයේ අංගයක් ලෙස එයට සහභාගි වූ සම්භාවනිය පිරිස නැවත ගොඩනැංවූ දුම්රිය මාර්ගයෙහි පල්ලයි සිට යාපනය දක්වා දුම්රියෙන් ගමන් ගත්හ. කිලෝමීටර් 38 ක් දිග පල්ලයි-යාපනය දුම්රිය මාර්ග කොටස නැවත ගොඩනංවන ලද්දේ ඉන්දිය රජය විසින් උතුරු දුම්රිය මාර්ගය නැවත ගොඩනැංවීම සඳහා ශ්‍රී ලංකා රජයට ලබාදෙන ලද ඇමරිකානු ඩොලර් මිලියන 800 සහන ණය යෝජනා ක්‍රමයක් යටතේය. ශ්‍රී ලංකා ජනාධිපති තුමාගේ ඉන්දිය සංචාරය තුළ 2010 ජුනි 9 වැනි දින නව දිල්ලියේදි ප්‍රකාශයට පත් කරන ලද ඉන්දියා- ශ්‍රී ලංකා ඒකාබද්ධ ප්‍රකාශනයෙහි මෙම එකඟතාව සටහන්ව ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ දැනටමත් අවසන්කර ඇති දුම්රිය මාර්ග කොටස් වලට 2013 වසරේ මැයි 14 වන දින ආරම්භ කරන ලද මැදවච්චිය-මඩු දුම්රිය මාර්ග කොටසද, 2013 වසරේ සැප්තැම්බර් මස 14 වැනි දින ගරු ශ්‍රී ලංකා ජනාධිපති තුමා විසින් ආරම්භ කරන ලද මන්තායි- කිලිනොච්චි දුම්රිය මාර්ග කොටසද, 2014 වසරේ මාර්තු මස 4 වැනි දින ගරු ප්‍රවාහන අමාත්‍යය වරයා විසින් ආරම්භ කරන ලද කිලිනොච්චි- පල්ලයි දුම්රිය මාර්ග කොටසද ඇතුලත් වේ.

**3.** ඉන්දිය රාජ්‍ය ව්‍යාවසායක් වන සිමාසහිත ඉර්කොන් ජාත්‍යන්තර සමාගම විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරයි. උතුරු දුම්රිය මාර්ගය නියමිත කාලයට අනුව සාද නිම කිරීමට ඉර්කොන් සමාගම ක්‍රියා කරමින් සිටි. මඩු- තලෙයිමන්නාරම දුම්රිය මාර්ග කොටසද, යාපනය- කන්කසන්තුරය දුම්රි

ය මාර්ග කොටසද, ඒ හා සබැඳි සංඥා සහ සංනිවේදන පද්ධති ගොඩනැංවීම ද එකවිට සිදු කෙරෙමින් පවතී.

4. යාපනය දක්වා වූ දුම්රිය මාර්ගය සාදා නිම කිරීම විශේෂ වැදගත් කමකින් යුක්ත වේ. එනම් මේ නිසා පෙර පරිදිම යාල් දේවි සීඝ්‍රගාමී දුම්රියට යාපනය හා කොළඹ නැවත සම්බන්ධකරමින් ධාවනය කිරීමට හැකි විමයි. මේ නිසා උතුරු දුම්රිය මාර්ගය, උතුරු පළාත තුළ ඇති ප්‍රදේශ පමණක් නොව, රටේ අනෙක් ප්‍රදේශද උතුරු පළාත සමග සම්බන්ධ කරනු ඇත. රටේ විවිධ ප්‍රදේශවල ජනතාව එකිනෙකාට සමීප කිරීම නිසා මෙමගින් රටේ සංවර්ධනය, ප්‍රතිසංධානය සහ සමාජ අනුකලනය ප්‍රවර්ධනය කෙරෙනු ඇත.

4. උතුරු දුම්රිය මාර්ගය නිම කිරීම නිසා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සබඳතාවද වර්ධනය වනු ඇත. මෙම ව්‍යාපෘතියේ අංශයක් වශයෙන් තලෙයිමන්නාරමෙහි ජැටියක් සෑදීමටද නියමිතය. එමගින් රාමේශ්වරම සහ තලෙයිමන්නාරම අතර ගමනාගමන සේවය යළි ආරම්භ කිරීමට හැකිවනු ඇත. කතරගම දක්වා දුම්රිය මග දිගු කොට, තලෙයිමන්නාරමේ සිට රාමේශ්වරම දක්වා නෞකා ප්‍රවාහනය ආරම්භ කල විට ශ්‍රී ලාංකීය පුරවැසියනට හම්බන්තොට සහ මාතර යන නගරවල සිට දුම්රියෙන් බුද්ධගයාවට ගමන් කල හැකි වනු ඇත. එමෙන්ම ඔවුනට උතුරු ඉන්දියාවේ ඇති ජම්මු කාශ්මීරයටත්, බටහිර ඉන්දියාවේ පිහිටි ගුජරාටයටත්, ඇසෑමය ඇතුලු ඊශාණ දිග පිහිටි ඉන්දිය ප්‍රාන්ත රාජ්‍යයන්ටත් දුම්රියෙන් ගමන් කිරීමට හැකිවනු ඇත.

5. ශ්‍රී ලංකාවේ ආසන්නම අසල්වැසියා සහ දීර්ඝ කාලීන හවුල්කරුවා වන ඉන්දියාව, ශ්‍රී ලංකාවට සිය සාමය, සමගිය, ජාතික සංහිඳියාව සහ සංවර්ධනය පිළිබඳ අපේක්ෂාවන් සාක්ෂාත් කර ගැනීම සඳහා පූර්ණ සහයෝගය ලබා දීමට සූදානම්ව සිටී. උතුරු දුම්රිය මාර්ග නැවත ගොඩනැංවීම ඉන්දියාව සහ ලංකාව අතර ඇති ඓතිහාසික හවුල්කාරිත්වයේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරයි.

***********

2014, ඔක්තොබර් 13.